# සුනාමිය සත්තුවත්තට වැදෙයි

සුනාමිය අප තව තවත් අතරමංකරන බව මේ වන විට හොඳින් ම පැහැදිලි වෙයි. ආන්ඩුවේ යන්ත්‍රය ක්‍රියාත්මක නොවීමට හේතු වූ ප්‍රධාන කරුණු අපි දැනටමත් සාකච්ඡාකර ඇත්තෙමු. ඒ කරුණු අතරට සුනාමි විපතෙන් රට ගොඩගැනීමට පත්කර ඇති කාර්යසාධක මණ්ඩලවල සේවය කරන ප්‍රධානීන්ගේ නොදැනුවත්කම ද වෙයි. පොළොවේ පයගසා නැති මොවුන්ගේ එකම සුදුසුකම ජනාධිපතිනියගේ හිතවතුන් හා හිතවතියන් වීම පමණකි. එහෙත් පොළොවේ පයගසා නැති එවැනිම ඊනියා බුද්ධිමත්තු මොවුන් ගැන චරිත සහතික ඉංගිරිසි පත්තරවලට නිකුත්කරති. මේ බුද්ධිමතුමන් යැයි කියාගන්නවුන් දන්නා එකම කාර්යය ඉංගිරිසියෙන් හෝ වෙනත් බටහිර බසකින් පළවන තොරතුරක් දැනුමක් නැවත වරක් ඉංගිරිසියෙන් කීම හෝ සිංහලෙන් කීම පමණකි.

අපට ලැබෙන්නේ යැයි කියන ආධාරවල ඇත්තේ මානව දයාව පමණක් යැයි සිතන්නෝ තවමත් බුද්ධියෙන් ලාබාලවූවෝ වෙති. මේ ආධාරවල තරම හොඳින් දන්නා ඉන්දියාව හා මියන්මාරය ඒ ප්‍රතික්ෂෙප කෙළේ ය. ආධාර එන්නේ දේශපාලනයක් සමග ය. අද ඇමරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර රටවලින් ලැබීමට නියමිත යැයි කියන ආධාර පවා අවසානයේ දී නොලැබෙන බව කොෆී අන්නන් මහතාට පවා පිළිගැනීමට සිදු වී ඇත. අන්නන් මහතාට ඉන්දියාවේ විපතට පත් ප්‍රදේශ නැරඹීමට යෑමට ඉන්දියන් බලධාරීහු ඉඩ නොදුන්හ. ලංකාවේ ද යම් අයකුගේ මැදිහත් වීමෙන් අන්නන් මහතාගේ උතුරු හා නැගෙනහිර සංචාරය වැළකිණි. එහෙත් ඒ සමග එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජිතයෝ ඒ පිළිබඳ තම කණස්සල්ල පළකළහ. එහි දී මෙරට විදේශ අමාත්‍යාංශය තම දීනබව නැවත වරක් මුළු ලොවටම ප්‍රදර්ශනය කෙළේ ය. ඔවුන් කියා සිටියේ අන්නන් මහතාගේ උතුරට යෑමට තිබූ ගමන නැවැත්වීමට තමන් කිසිවක් නොකළ බව ය. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජිතයන්ට විදේශ අමාත්‍යාංශය කිවයුතුව තිබුණේ තමන්ගේ වැඩක් බලාගන්නා ලෙස ය. ඉන්දියාව අන්නන් මහතාට තමිල්නාඩුවට යෑමට ඉඩ නොදුන්විට ඔය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජිතයන්ට කණස්සල්ලක් ඇති නොවිණි. ඒ එලෙස විරෝධය (කණස්සල්ල පළකිරීම විරෝධය පෑමේ ක්‍රමයක් වෙයි.) පළකිරීමෙන් වැඩක් නොවන බව ඔවුන් දන්නා බැවිනි. එහෙත් මෙරට සිටින තකතීරු උගතුන් ඉදිරියේ විරෝධය පෑමට ඇති අපහසුව කුමක් ද? නිවට කරණැවැමියා දුටුවිට එළුවා ද නිකම් සිටින්නේ නැත.

අපේ රටේ ප්‍රධාන ම ප්‍රශ්නය දීන උගතුන් බවට සැකයක් ඇත්තේ ම නැත. මේ දිනයන්ට කළහැක්කේ අපේ දැනුමට සිනහසීම පමණකි. එහෙත් මේ උගතුන්ට කළහැකි වූයේ රික්ටර් මාපකයේ මෙතරම් ප්‍රමාණයක භූමිකම්පාවක් වී ඇතැයි කීම පමණකි. ඒ ඔවුන් දන්නා දේ ය. එසේත් නැත්නම් ඔවුන්ට කළහැක්කේ හවායි හෝ වෙනත් තැනක පිහිටි ආයතනකට කතාකර තොරතුරු ලබාගැනීම පමණකි. මේ තකතීරු උගතකුට අනුව ගෝලීයකරණය නොතිබෙන්නට අප මහත් අමාරුවකට මුහුණ පෑමට තිබුණි. එක් කලක මාක්ස්වාදියකු ද වී සිට උතුරු නැගෙනහිර පළාත් සභාවේ ඇමතිවරයකු ද වී සිටි මොහුට අනුව ගෝලීයකරණය නිසා අපට දැන් ආධාර ලැබෙයි. මේ ආධාර පිටුපස දේශපාලනයක් ඇති බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. ඒ අතර ඇමරිකා එක්සත් ජනපදයෙන් ලැබෙන ආධාරවලට ඔවුන් මෙරටට එවන ගුවන්යානාවල ගාස්තු පමණක් නොව හමුදා භටයන්ගේ වැටුප ද අයත් වෙයි. සුනාමිය තිබුණත් නැතත් මේ භටයන්ට වැටුප් ගෙවිය යුතු බව අපි කවුරුත් දනිමු. අනෙක් අතට අන්නන් මහතා ද පිළිගෙන ඇති ආකාරයට  පොරොන්දු ආධාර සියල්ල නොලැබෙනු ඇත. ආධාර පෙන්වා දේශපාලන වුවමනාවන් ඉටුකරගැනීම ද මෙහි දී සිදුවෙයි. දැනටමත් ආධාර ඊනියා සාමය හා සාම සාකච්ඡා සමග සම්බන්ධකර ඇත. වැඩිකල් නොගොස් ආධාරවල දේශපාලන පැත්ත වැඩි වැඩියෙන් මතුවනු ඇත. හැකි ඉක්මනින් ඇමරිකන් හමුදා භටයන් ආපසු යැවීම අපේ යහපතට හේතුවනු ඇත.

සුනාමියෙන් අපට ඉගෙනගැනීමට ඇති දේ බොහෝ ය. ආණ්ඩුව කළ යුතුවන්නේ වහාම සවේච්ඡා සංවිධාන අතර සම්බන්ධීකරණ ජාලයක් ගොඩනැගීම ය. ඒ අතර ස්වෙච්ඡා සංවිධාන ගැන සෙවිල්ලෙන්  සිටීම ය. සුනාමි දියේ මාළු බෑමට සූදානම් වූ සංවිධාන ද ඇත. මේ සංවිධාන හඳුනාගත යුතු වෙයි. ගොඩනැගිලි හා නිවාස තැනීමේ දී දැන්වත් මෙරටට ඔරොත්තුදෙන අයුරින් අඩු වියදමෙන් ඒ කිරීමට කටයුතු කළ යුතු ය. ඒ සඳහා අවශ්‍ය දැනුම ඇති පුද්ගලයෝ වෙති. ඇතැම්විට ආයතන ද වෙයි. ඔවුන් හා ස්වේච්ඡා සංවිධාන සම්බන්ධකළ යුතුවෙයි. එහෙත්

© Prof. Nalin De Silva

පොළොවේ පය නොගැසූ තාරාවෝ ඉගිලෙති. මේ ආණ්ඩුවටවත් විපක්ෂයේ දේශපාලකයන්ටවත් ඊනියා උගතුන්ටවත් රට ගොඩගැනීමට නො හැකි බව පැහැදිලි ය. එකමුතුවක් ගැන කීව ද ඒ ප්‍රදර්ශනයට පමණකි. ඇත්තේ දේශපාලන ව්‍යාපෘති පමණ ය. විපතටපත් ජනතාවගේ හිත හැදීමට, එනම් උපදේශන සේවයට, සුදුසුම භික්ෂූන් වහන්සේලා වෙති. උන්වහන්සේලාට ඒ සඳහා පුහුණුවක් ඇත් දැයි තකතීරු උගතකු ඇසීමට ඉඩ ඇත. උන්වහන්සේලාට ඒ සඳහා බටහිර රටකින් ලැබුණු ඩිප්ලෝමාවක් නම් නැති බව සැබෑ ය. එහෙත් උන්වහන්සේලාට අවුරුදු දෙදහස් තුන්සීයක මෙරට අත්දැකීම් ඇත. මෙහි දී ද සුනාමි දියේ මාළු බාන උපදේශන සේවාවන්ගෙන් ප්‍රවේසම් විය යුතු ය.

බොහෝ දෙනා දන්නා පරිදි සත්තු සුනාමියෙන් ගැලවී පණ බේරාගත්හ. ඔවුන්ට අනතුර ගැන හැඟීමක් තිබුණා පමණක් නොව දිවිය යුත්තේ කිනම් දිශාවකට ද යන්න ගැන ද තේරුමක් තිබිණි. මීහරකුන් ද රට ඇතුළට දිවගිය බව වාර්තා වෙයි. එහෙත් යම් අයුරකින් දෙහිවල සත්වොද්‍යානය වෙරළ ආසන්නයේ තිබිණි නම් සතුන්ට කුමක් සිදුවීමට තිබුණි ද? උන්ට දිවයෑමට හැකිවනු ඇත්තේ එක්කෝ බිත්තියක් දක්වා පමණකි. නැත්නම් කම්බි වැටක් දක්වා පමණකි. එසේ වී නම් ගාල් කර තිබූ සතුන්ට අත්වනු ඇත්තේ මරණයයි. අපේ ඊනියා උගතුන්ට පින්සිදුවන්නට අපි ද ගාල්කර ඇති සත්තු වෙමු. අප ගාල්කර ඇත්තේ බටහිර දැනුමෙන් ය. අපි අපේ දැනුම් පද්ධති විනාශකර ගත්තෙමු. අද අප ජීවත්වන්නේ කොළඹ ගෙන්දගම් පොළොව කේන්ද්‍රකරගෙන ය. කොළඹ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ප්‍රතිඵලයක් වෙයි. අප ජීවත්වන්නේ ජීවත්වීමට නොසුදුසු ප්‍රදේශවල ය. ගාළුපාර ඇත්තේ මිනිසුන් හා භාණ්ඩ කොළඹට ප්‍රවාහනය කිරීමට ය. දුම්රිය මාර්ගය ද එසේම ය. අපේ දැනුම අපේ ජීවන රටාව බටහිර ක්‍රිස්තියානි ආධිපත්‍යයට යටවී විනාශකරගත් අපට අද වෙනත් විකල්පයක් නැත. අප කලක සිට කියා ඇත්තේ එක් දැනුම් පද්ධතියක් පමණක් මත යැපීමේ භයානකත්වය ගැන ය. සුනාමියෙන් අවාසනාවකට එය දැන් ඇස් පනාපිට පෙනෙන්නට ඇත. තකතීරු උගතුන් මොන බයිලා කීව ද සුනාමි අවස්ථාවේ බටහිර දැනුම් පද්ධතිය මුළුමනින්ම කඩා වැටුණි. අපට කළ හැක්කේ රික්ටර් මාපකය රැගෙන එහාට මෙහාට දිවීම පමණකි. තම පද්ධති අමතක නොකළ සත්තු සුනාමියෙන් ගැලවුණ හ. අපේ පද්ධති අමතක කළ ඒවාට සිනහසෙන අපට සිදු වී ඇත්තේ බටහිර දැනුමෙන් ගාල් වී මිය යෑමට ය. අප ජීවත්වන්නේ මානව සත්වෝද්‍යානවල ය. මෙරට විශ්වවිද්‍යාල යනු ප්‍රධානම මානව සත්වෝද්‍යාන ය. එහි කාර්යභාරය වී ඇත්තේ තරුණ තරුණියන් ගාල්කර බටහිර දැනුමෙන් ඉතා සුළු කොටසක් ඔවුන්ට දී අන්තර්ජාලයේ වහළුන් කර අපේ දැනුමට සිනහසීමට උගන්වා රික්ටර් මාපකය අතට දී අටයි දශම නමයයි කියමින් එහේ මෙහේ දුවන රටට වැඩක් නැති පිරිසක් බවට පත්කිරීම ය. ඔවුන්ට බටහිර දැනුම අපේ දැනුමට අවශෝෂණයකිරීමට නො හැකිය. අපේ බොහෝ ජ්‍යෙෂ්ඨ උගතුන්ට ද ප්‍රමාණවත් බටහිර දැනුමක් නැත. ඔවුන්ට ද ඇත්තේ ඔවුන්ගේ ස්වාමිවරු බටහිර නිර්මානයකරන දැනුමෙන් ඉතා කුඩා කොටසක් පමණකි.

අද මෙරට සිදුවන ඊනියා ශාස්ත්‍රීය විවාද වැඩිම වුවහොත් බටහිර විවාදවල බොල් දෝංකාර පමණක් වෙයි. අපි උදාහරණයකට පසුගියදා මියගිය ඩෙරීඩා ගනිමු. ඩෙරීඩා ගැන මා කියවා ඇති තරමින් මට හැඟෙන්නේ ඔහු එතරම් ශ්‍රෙෂ්ඨ චින්තකයකු නොවන බව ය. ඔහුගේ විසංයෝජනය හා ඊනියා ලිවීම (රයිටින්) ගැඹුරු සංකල්ප නො වෙයි. ඩෙරීඩාගේ විසංයෝජනය බුදුන් වහන්සේගේ විසංඛාරය අහළකින්වත් තැබීමට නො හැකිය. ඩෙරීඩා ගැන මෙරට විවේචනකරන්නෝ හේබර්මාස් හෝ වෙනත් අයකු ඩෙරීඩා ගැන කියා ඇති දේ වමාරති. ඩෙරීඩා වීරයකු ලෙස සලකන්නෝ ඩෙරීඩා බෙදාගැනීමට පොරකති. ඩෙරීඩා ගැන වඩාත් හොඳින් දන්නේ තමායැයි කීමට දඟලන හිටපු කතෝලික පූජකයෙක් විසංඛාරය යනු විසංයෝජනය යැයි කියමින් බුදුන් වහන්සේ ඩෙරීඩාගේ මට්ටමට පහතට ඇදදමයි. තවත් පඬියෙක් ඊනියා ද්විමය ප්‍රතිවිරුද්ධතා ගැන කතාකරන්නේ ඒ ප්‍රතිවිරුද්ධ නැති ලෝකයක් ඇතැයි යන සිතිවිල්ලෙනි. ඩෙරීඩාගේ ඔෆ් ග්‍රැමටලොජි පොතට ගයාත්‍රි ස්පිවැක් ලියූ පෙරවදනේ කෑලි එහෙන් මෙහෙන් අහුලාගෙන මේ ව්‍යාජ කවියා ඩෙරීඩා සොසූර්ගේ සංඥායකය හා සංඥායිතය ගැන කරනලද විවේචනය ගැන ස්පිවැක් පවසා ඇති අදහස් තමාගේ අදහස් ලෙස දක්වයි. මේ අතර සුනාමියත් සමග විශ්වවිද්‍යාල වයි පාර්ශවයකට හා විශ්වවිද්‍යාල නොවන ඉසෙඩ් පාර්ශවයකට දෙකඩ වී ඇති එක්ස් කණ්ඩායම ඩෙරීඩා බෙදාගැනීම පැත්තකට දමා දේපොල බෙදාගැනීම ගැන පශ්චාත්නූතනවාදී අරගලයක යෙදී සිටියි. කසිකබල් මාක්ස්වාදීන්ගේ සිට මේ විහිළුකාරයන් දක්වා කෙරී ඇත්තේ බටහිර දැනුම ඔස්සේ මානව සත්වෝද්‍යානවල ගාල්වීම පමණකි. මේ සත්තුවත්තෙන් ගැලවී ඉවතට යෑමට මේ කාලයයි.

© Prof. Nalin De Silva